රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ: 17/2018

මගේ අංකය : EST-4/02/MSF/0419
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2018.08.23

අමාත්‍යාංශ ලේකම්වරුන්

**ගරු අමාත්‍යවරුන්ගේ/ නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ සහාය කාර්යය මණ්ඩලයට අයත් කළමනාකරණ සහකාර සහ ප්‍රාථමික සේවා ගණයට අයත් සේවකයින් ස්ථිර කිරීම**

ගරු අමාත්‍යවරුන්ගේ/ නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ කාර්යය මණ්ඩල සඳහා රාජ්‍ය සේවයෙන් පරිබාහිරව බඳවාගත් පහත සුදුසුකම් සපුරන සේවකයින් ස්ථිර කිරීමට 2016.10.11 දින පැවැත් වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

i. ගරු අමාත්‍යවරුන්ගේ/ නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ කාර්යය මණ්ඩලයට රාජ්‍ය සේවයෙන් පරිබාහිරව බඳවාගෙන සිටින කළමනාකරණ සහකාර සේවයේ හා ප්‍රාථමික සේවා ගණයට අයත් තනතුරක සතිඅන්ත හා රජයේ නිවාඩු දින ද ඇතුළත්ව වසර 03ක අඛණ්ඩ සේවා කාලයක් ඇති සේවකයකු වීම.

ii. පත්කරනු ලබන තනතුරුවලට අදාළ අනුමත සේවා ව්‍යවස්ථා හෝ බඳවාගැනීමේ පරිපාටිවලට අනුව නියමිත සුදුසුකම් සපුරා තිබීම.

02. මේ යටතේ ස්ථිර කිරීමට සුදුසුකම් ලබන සියලුම සේවකයන් පහත සඳහන් විධිවිධාන අනුව ස්ථිර සේවයට පත්කිරීම සඳහා අවශ්‍ය පියවර ගත යුතුය.

i. කළමනාකරණ සහකාර තනතුරුවලට පත්කර ඇති සේවකයින් රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ තනතුරුවලට වඩා පහළ සේවා ගණයේ දෙපාර්තමේන්තුගත තනතුරුවලට පත් කිරීම.

ii. ප්‍රාථමික සේවා ගණයට අදාළ සේවකයින් ඒකාබද්ධ සේවාවන්ට අයත් සේවා ව්‍යවස්ථාව සඳහන් නියමිත සුදුසුකම් සපුරා ඇත්නම් ඔවුන් ඒකාබද්ධ සේවාවන්ට අයත් තනතුරුවලට පත්කිරීම.

iii. සේවකයින් තනතුරුවලට පත් කිරීම සඳහා තම අමාත්‍යාංශයේ හෝ තම අමාත්‍යාංශයට අයත් ආයතනවල හෝ තනතුරු පුරප්පාඩු නොමැති නම් අනෙකුත් අමාත්‍යාංශවල පත්වීම් බලධරයන් විමසා එකී තනතුරුවලට පත් කිරීමට අදාළ පියවර ගැනීම.

iv. එලෙස ස්ථිර තනතුරු සඳහා පත්කරන ලද සේවකයින් ගරු අමාත්‍යවරුන්ගේ/ නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ ධූරකාලය අවසන්වීමෙන් අනතුරුව පමණක් ස්ථිරව පත්කරනු ලැබූ තනතුරු අයත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අනුයුක්ත කිරීම.

පද්මසිරි ජයමාන්න
ලේකම්
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ සහ
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය